# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1652 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 30 /10 /2024<br>පැය 1445 |

## මාධ්‍ය නිවේදනය

**01. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - මරදාන පොලිස් ස්ථානය.**

2024.10.29 වන දින උදෑසන කාලයේ මරදාන පොලිස් වසමේ ගුණසේකර මාවත ආසන්න ප්‍රදේශයේදී විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 505 මිලි ග්‍රෑම් 500 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් **සැකකරු අවුරුදු 53 ක් වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මුන්දලම පොලිස් ස්ථානය.**

2024.10.29 වන දින උදෑසන කාලයේ මුන්දලම පොලිස් වසමේ වීහෙන්කට්ටුව ප්‍රදේශයේදී මුන්දලම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 75 (බෝතල් 100) ක්, ගෝඩා ලීටර් 405 ක්, තඹ දඟර 01 ක් හා මත්පැන් ප්‍රවාහනයට යොදාගත් කාර් රථය සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන මංගලඑළිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මුන්දලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් හා හෙරෝයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.10.29 වන දින උදෑසන කාලයේ පැලියගොඩ පොලිස් වසමේ 0 පැලියගොඩ ප්‍රදේශයේ දී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15**

**මිලි ග්‍රෑම් 250 ක් හා හෙරෝයින් ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් **සැකකරුවන් අවුරුදු 24 වයසේ පසුවන වැල්ලම්පිටිය හා පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**